**ශීර්ෂය - 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - 2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය වූ රු.1,448,474,902 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ- 6) ආරම්භක ශේෂය යටතේ දැක්විය යුතු වුවත් එම ශේෂය රු.810,416,523 ක් ලෙස දක්වා ඉතිරි වටිනාකම වූ රු.638,058,379 ක් ආරම්භක ශේෂයට එකතුකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | CIGAS වල දක්වන ආකාරය වන අතර, එය අපහට වෙනස් කළ නොහැකි බව. | ඉකුත් වර්ෂයේ විගණිත ගිණුම්වල අවසාන ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ගත යුතුවේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම රු.470,236,029 කින් වර්ෂයේ ප්‍රාග්ධනිත කිරීම රු.11,225,741 ක් එනම් මුළු මූලධන වියදමින් සියයට 2 ක් විය. නියැදි පරීක්ෂණයට අනුව මූලධන වියදම් ලෙස දරන ලද එකතු වටිනාකම රු.10,863,751 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් මේ වන විට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇති බව. | ප්‍රාග්ධනිත කළ යුතු සියලුම මූලධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතු වේ. |
| (iii) | ආයතනය සතු සියලුම ඉඩම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ-6) විධිමත් තක්සේරු අගයකට ගිණුම් ගත කළ යුතු නමුත් වටිනාකම රු.155,000,000 ක් වූ දැල්පිටිය උප පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් ඉඩම ගිණුම් ගත කර නොතිබුණි. | අදාළ ස්ථාවර වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අදාල වත්කම් ගිණුම්ගත කර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික් කාර්යාලය සහ මාතලේ මධ්‍යම පැළ තවාන වෘක්ෂලතා ලේඛනයද, මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ එළදා ලේඛනයද යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කරමින් පවතින බව. | ලේඛන යාවත්කාලීනව පවත්වා නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, ලේඛන යාවත්කාලීන කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු සමාලෝචිත වර්ෂයේ 1.6.1 (ආ) ඡේදයේ නිරීක්ෂණයට අදාල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කලමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 8 ක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන රු.102,000,000 න් රු.16,603,635 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණු අතර එම ප්‍රතිපාදන ඉතිරිවීම මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් 91 ත් අතර පරාසයක පැවතුණි. | අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | නිවැරදිව වියදම් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතු වීමත්, වෙන් කළ ප්‍රතිපාදන ඵලදායීව සැලසුම් කර පූර්ණ උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.2 වියදම් සාවද්‍ය ලෙස ගිණුම්ගත කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ තැපැල් හා සන්නිවේදන වියදම් වැය විෂයය වූ 289-2-1-0-1402 යටතේ වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදනය රු.6,000,000 වූ අතර අදාළ වියදමේ වාර්ෂික ශුද්ධ ප්‍රතිපාදන සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා සාවද්‍ය ලෙස රු.449,216 ක වියදම් 289-2-1-0-1409 වෙනත් වැය විෂයය යටතේ දරා තිබුණි. | 2024 වර්ෂයේ දුරකථන හා තැපැල් වියදම් අසාමාන්‍ය ලෙස වැඩිවූ බැවින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුන බව. | විධිමත් පරිදි ප්‍රතිපාදන මාරු කිරීමකින් හෝ අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමකින් තොරව සාවද්‍ය ලෙස ගිණුම් තැබීම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගත යුතුය. |

## 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති , රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ 15 වගන්තිය | 289,964,900 | අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමෙන් පසුව කෘෂිකාර්මික භෝග වගාකරන සහ සකස් කරන තැනැත්තන්ට සහනාධාර සහ මූල්‍යමය හෝ වෙනත් ආධාර ප්‍රධානය කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු වුවද, අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල අපනයන ප්‍රවර්ධන ආධාර ප්‍රතිලාභීන් වෙත ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන එම අනුමත වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, විධිමත් පරීක්ෂණයක් පවත්වා ඊට පරිබාහිර කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධව කටයුතු කළ යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 169 | 107,362 සිට 397,260 දක්වා | බාහිර සැපයුම්කරුවන් විසින් සපයන නිෂ්පාදිතයන් කුළුබඩු අලෙවිසැල තුළ විකුණා ලැබෙන මුදලින් සියයට 75 ක් අත රඳවාගෙන පසුව අදාළ | මුදල් ගෙවීම් සම්බන්ධ කටයුතු පරිගණක දත්ත පද්ධතිය ඇති කිරීමට ප්‍රථම ගිණුම් ගත | මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර, විධිමත් පරිදි ලේඛන නඩත්තු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සැපයුම්කරුවන් වෙත ගෙවීම් කරනු ලබයි. එහෙත් එම මුදල් ගෙවිය යුතු සැපයුම්කරුවන් කවුරුන්ද යන්න හඳුනාගත හැකි ලේඛනයක් නඩත්තු කිරීමෙන් තොරව අවස්ථා 16 කදී අදාළ මුදල් ශේෂයන් නිලධාරීන් අත රඳවාගෙන තිබුණි. | කිරීමේදී ඇතිවූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ප්‍රමාදයන් සිදු වුවද වර්තමානය වන විට සැපයුම්කරුවන්ගේ මුදල් සතිපතා ගිණුම් ගත කරන බව | නොකළ හා මුදල් අත රඳවාගත් නිලධාරීන් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 785(iii)ආ | 117,112 | අලුත්වැඩියාවේ ස්වභාවය මත අවශ්‍ය අමතර කොටස් හා සේවා ලබා ගැනීමට නියෝජිත ආයතනය මඟින් හෝ මිල කැඳවීම් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර වාහනයක් අලුත්වැඩියා කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම සම්බන්ධව අදාල නිලධාරීන්ට විධිමත් පරිදි කටයුතු කිරීමත්, මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුව කටයුතු කිරීමට අභ්‍යන්තර වැඩ පිළිවෙල ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.1.1, 2.3 | | මූල්‍ය නොවන වත්කම් සෑම වර්ෂ 05 කට වරක්ම තක්සේරු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී මූල්‍ය නොවන වත්කම් නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | සෑම වර්ෂ 05 කට වරක්ම වත්කම් තක්සේරු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණනදීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වසර 1 සිට 5 දක්වා කාල පරාසයකදී අයවිය යුතු එකතු වටිනාකම රු.451,079 ක ණය ශේෂයක් ද, සේවය අත්හැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ වසර 1 සිට 20 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.720,136 ක ණය ශේෂයක් 2024 දෙසැම්බර් 31 දින තෙක් අයකරගෙන නොතිබුණි. | රු.907,874 ක ණය ශේෂ පොතෙන් කපා හැරීමට අනුමැතිය සඳහා යොමුකර ඇති අතර රු.263,341 ක ණය ශේෂ ඇපකරුගෙන් වාරික වශයෙන් කරන බව. | අයවිය යුතු ණය ශේෂයන් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, ඒවා අය කිරීමට කාලීනව පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණනදීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයෙන් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ සඳහා 2024 වර්ෂයේ ගිණුම් කාරක සභාවේ නියෝගයක් පැවතියද 2025 මාර්තු 31 දින වන විටත් ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | 2025 – 2030 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අනුමැතිය සඳහා කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරි මාර්ග අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව. | රජයේ ගිණුම් කාරක සභාවේ නියෝගයට අනුව කටයුතු කර සංයුක්ත සැලැස්ම කඩිනමින් සකස් කළ යුතු බව. |
| (ආ) | අපනයනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලු සංවර්ධන වැඩසටහන් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සැලසුම් කළ යුතු වුවත් පුත්තලම දිස්ත්‍රික්කයේ සැලසුම් කර තිබූ වැඩසටහන් 6 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගික ගැටළුවලට මුහුණ දීමට සිදු වන බව. | සැලසුම් කරන ලද සියලුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර, සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කළ යුතුය. |

## 4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවි පුහුණුවට අදාළ වැඩසටහන් 12 ක් හා ප්‍රතිලාභීන් 180 ක් සඳහා ඉලක්ක ලබා දී තිබුණද එහි ප්‍රගතිය පුහුණු වැඩසටහන් 04 ක් හා ප්‍රතිලාභීන් 50 ක් පමණක් වූයෙන් ප්‍රගතිය පිළිවෙලින් සියයට 33 ක් හා සියයට 28 ක් වැනි පහළ අගයක පැවතුණි. | ගොවින්ගෙන් ලැබෙන ඉල්ලීම හා අවශ්‍යතාවය මත ඉලක්ක සංශෝධනය සිදු කරන බවත්, පුත්තලම් දිස්තික්කය තුළ ක්‍රියාත්මක කළ නොහැකි වැඩසටහන් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව. | ඉලක්ක ළඟා කර නොගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් ඉදිරියේදී අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීමට විධිමත් අධීක්ෂණයක් කිරීමත් කළ යුතුය. |
| (ආ) | එක් එක් පළාත් සහ දිස්ත්‍රික් වශයෙන් තෝරාගත් පැළ සඳහා ඉලක්ක ලබා දී තිබූ අතර ඒ සඳහා ගොවීන් තෝරාගෙන ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා අදාළ පැළ ලබා දි තිබුණි. නමුත් භෞතික පරීක්ෂාවේදී පැළ විනාශ වීම, නඩත්තුවකින් තොරව පැවතීම, අස්වනු ලබා ගන්නා තෙක් පසුවිපරම් නොකිරීම ආදී හේතු මත පැළ ඉලක්කවලින් 50% ට වඩා අඩු ප්‍රගතියක් නිරීක්ෂණය විය. | විවිධ කාලගුණික, දේශගුණික හා පළිබෝධ රෝග ආදිය හේතුවෙන් පැළ ස්ථාපන ප්‍රතිශතය අඩු වැඩි විය හැකිය. ගොවීන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්වලට ගොවීන්ගේ උනන්දුව හා ඉල්ලුම මත ඉදිරියේ දී පැළ ස්ථාපන ප්‍රතිශතය ඉහළ අගයක් ගනු ඇති බව. | - එම - |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල පැළ නිෂ්පාදනය ධාරිතාවය තීරණය කිරීමේදී පදනම් කරගනු ලබන නිර්ණායකයන් මොනවාද යන්න තහවුරු නොවුණි. දැනට එම පැළ තවාන්වල පවතින ධාරිතාවය හා වර්තමාන නිෂ්පාදනය සැලකූ විට විශාල වෙනස්කම් පැවති අතර එය සියයට 18 සිට සියයට 64 දක්වා පරාසයක පැවතුණි. මේ අනුව ක්ෂේත්‍රගත කළ හැකි වූ පැළ ප්‍රමාණය 1,181,742 කින් අඩු වී පැවතුණි. | දැනට සිටින කම්කරුවන් ප්‍රමාණය නොසලකා අවශ්‍ය සම්පූර්ණ කම්කරුවන් ප්‍රමාණය ලබාගත හැකිය යන උපකල්පනය මත නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතාවය නිශ්චය කිරීම හේතුවෙන් අපේක්ෂිත ඵලදාව ලබාගැනීමට නොහැකි වී ඇති අතර පැළ නිශ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය සම්පත් ඉදිරියේදී වැඩි කළහොත් නිෂ්පාදනය උපරිම කළ හැකි බව | විධිමත් නිර්ණායක මත පැළ තවාන්වල උපරිම ධාරිතාවය තීරණය කිරීමටත් පැළ තවාන්වල උපරිම ධාරිතාවයෙන් පැළ නිෂ්පාදනය කර ක්ෂේත්‍රගත කිරීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව ගම්මිරිස් වැළකින් වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් 01 ක් ලබා ගත හැකි ව තිබූ අතර සියලු තාක්ෂණික දැනුම භාවිතා කරමින් පවත්වා ගෙන යනු ලබන වල්පිට පටක රෝපණ මධ්‍යස්ථානය සතු ගම්මිරිස් වැල් වලින් ලැබූ ඵලදාව නිර්දේශිත ඉලක්කයෙන් සියයට 65 කින් අඩු වී තිබුණි. | රටතුළ රසායනික පොහොර ආනයනය තහනම් කිරීම මත පොහොර හිඟවීම හා ගම්මිරිස් වැල් වලින් 90% ක පමණ අවුරුදු 35 ඉක්මවූ වැල් වීම නිසා අස්වැන්න අඩු වී ඇත. ඉදිරියේදී මෙම පැරණි වැල් ඉවත් කොට අළුතෙන් පැළ සිටුවීමට සැලසුම් කොට ඇති බව. | ඉදිරි වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දෙපාර්තමේන්තුවේ මූලික හා ප්‍රධාන කාර්යයක් වනුයේ අපනයන කෘෂිකාර්මික භෝග ව්‍යාප්තිය සිදු කිරීම වන අතර ඒ සඳහා පසුගිය වසර 11 ක කාලය තුළ රු.මිලියන 2507 ක් වැය කර තිබුණද, 2012 වර්ෂයට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට භෝග වර්ග 05 ක ක්ෂේත්‍රයේ පවතින බිම් ප්‍රමාණය අක්කර 15,875 කින් හෙවත් සියයට 21 කින් අඩු වී තිබුණි. | නිවැරදි සැසඳීමකට නම් 2012 වර්ෂය වෙනුවට 2014 වර්ෂය පාදක වර්ෂය ලෙස සලකා බැලිය යුතු වේ. 2014 වර්ෂය පදනම් කරගෙන අදාළ බෝග ව්‍යාප්තිය සංසන්දනයේ දී පසුගිය වසර 9 ක කාලය පුරා බෝග වර්ග සියල්ලෙහි ම වගා වපසරියෙහි අඩුවීමක් සිදු වී නොමැති බව. | අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර නව උපායශීලී සැලසුම් සකසා අරමුණු කරා ළඟාවීමේ වැඩ පිළිවෙලක් සැකසිය යුතුය. |
| (ඊ) | කොකෝවා හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා 2023 වර්ෂයේදී රු.මි.8,846 ක් වියදමක් දරා තිබූ අතර මෙම නිෂ්පාදනය මෙරට තුළ පරිභෝජනයට අවශ්‍ය තරමට හෝ නිෂ්පාදනය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මෙරට අපනයන බෝග වර්ග ආනයන කිරීමට දරා ඇති වියදමින් සියයට 82 ක් ම කොකෝවා සඳහා යොදවා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් කොකෝවා නිෂ්පාදනය මෙරට අවශ්‍යතාවයට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීම හා එකලස් කිරීම යන කරුණු සඳහා උචිත වැඩ පිළිවෙලක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් මෙම ආනයන වියදම් ඉහළ ගොස් තිබුණි. | කොකෝවා සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ සන්සන්දනය කිරීමේ දී දේශීයව අඩු නිෂ්පාදනයක් සිදුවීම හා ජාත්‍යන්තර මිල සමඟ තරඟ කිරීමේදී දේශීය නිෂ්පාදකයන්ට පවතින හැකියාව අවම මට්ටමක පවතී. තවද, සත්ව හානි හේතුවෙන් කොකෝවා අසවැන්නට දැඩි ලෙස හානි සිදුවන බැවින් වගාව ප්‍රවර්ධනය කිරීමේ ගැටළු පවතී. මේ සඳහා පිළියමක් වශයෙන් වතු අංශය සමඟ එක්ව අතුරු බෝගයක් වශයෙන් රබර් වගාව අතර, කොකෝවා වගාව ප්‍රවර්ධනයට දැනට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අපනයන බෝග වර්ග ආනයනය කිරීම අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති රාමුවක් හා වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | ක්‍රියාත්මක වූ සංවර්ධන වැඩසටහන් යටතේ එක් එක් ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ 14 ක ප්‍රගතිය සියයට 50 ට වඩා පහළ මට්ටමක පැවතුණි. | එක් එක් බෝගයන්ගේ මත පදනම් ව සමස්ත පගතිය ගණනය කිරීම යෝග්‍ය නොවන බවත්, එක් බෝගයකින් ආවරණය නොවන ඉලක්ක ප්‍රමාණය වෙනත් බෝගයකින් ආවරණය සිදු විය හැකි බව. | ව්‍යාපෘති තෝරා ගැනීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කළ නිලධාරීන් පිළිබඳව විධිමත් පරීක්ෂාවක් කිරීමටත්, සංවර්ධන වැඩසටහන්වලින් අපේක්ෂිත ප්‍රගතිය ළඟාකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සැකසීමටත් කටයුතු කළ යුතුය. |

## 4.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුල්හාල්කැලේ පැල තවාන පිහිටි, අක්කර 05 රූඩ් 01 ක ඉඩම 1980 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව විසින් භුක්ති විදිනු ලබන නමුත් විධිමත් පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කර නොතිබීම හේතුවෙන් ඉඩමෙන් අක්කර 02 රූඩ් 2 පර් 5 ක ප්‍රමාණයක්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පුද්ගලික සමාගමක් වෙත වසර 30 ක කාලයක් සඳහා බදු දී තිබුණි. | මෙම මුල්හාල්කැලේ වත්ත නම් වූ ඉඩම 1980 වර්ෂයේ සිට අප දෙපාර්තමේන්තුව විසින් භුක්ති විදිනු ලබන නමුත් මෙතෙක් විධිමත් පරිදි දෙපාර්තමේන්තුව වෙත අත්කර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති බව. | පරිහරණය කරනු ලබන භූමිය විධිමත්ව පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව පරිහරණය කරන අක්කර 365 ක ඉඩම් කොටස් 30 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයිතිය පවරාගෙන නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ පවරාගැනීමට කටයුතු කෙරෙමින් පැවති ඉඩම් කොටස් 30 න් ඉඩම් කොටස් 03 ක පවරාගැනීමේ කටයුතු අවසන් කොට ඇති අතර පවරාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින ඉඩම් කොටස් 27 ක් පවතින බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුව භාවිතා කරන වෙනත් අමාත්‍යාංශවලට අයත් වාහන 25 ක් පවරා ගැනීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශවලට අයත්ව තිබූ වාහන වලින් යතුරුපැදි 11 ක් සහ කැබ් රථ 01 ක් මේ වන විට දෙපාර්තමේන්තුවේ නමට මේ වන විට පවරා ගෙන ඇති බව. | වාහන වහාම පවරා ගැනීම හෝ අදාල ආයතනවලට විධිමත්ව භාර දීම හෝ කළ යුතුය. |
| (ඈ) | රු.244,375 ක වටිනාකමකින් යුත් වල්පිට පටක රෝපණ මධ්‍යස්ථායේ විසුරුම් ජල පද්ධතිය වර්ෂ 03 ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වගා ළිං වලින් එන ජලය අධික මඩ සහිත වීමෙන් ඒවා විසුරුම් ජල සම්පාදන පද්ධතිය තුල සිරවීම හේතුවෙන් එම පද්ධතිය අකාර්යක්ෂම විය. අවස්ථා ගණනාවකදී අදාල ආයතනය දැනුවත් කළ අතර, ඒ සඳහා කළ පිළියම් වලින්ද අදාල ගැටළුව නිරාකරණය කර ගැනීමට නොහැකි වූ බව. | වත්කම් ඵලදායී ලෙස යෙදවීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. |
| (ඉ) | නාරම්මල අතුරු වගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ මෙහෙවර තුළ පොල් වගාව යටතේ අපනයන කෘෂි බෝග වගා කිරීමේ ශක්‍යතාවය අධ්‍යනය කිරීම අන්තර්ගත වුවත් භූමියේ පවතින පොල් ගස්වලින් වැඩි ප්‍රමාණයක් අවුරුදු 50 ත් අවුරුදු 84 ත් අතර වූ පැරණි පොල් ගස් වූයෙන් ආයතනයේ මෙහෙවරට අනුව ක්‍රියාකාරීත්වය හැඩගස්වා නොතිබුණි. | මේරූ පොල් ගස් අතර පොල් පැළ 500 ක යටි පොල් පැළ වගාව සිදු කර අවසන්ය. වයස්ගත පොල් වගාව ඉවත් කිරීමට අවශ්‍යව ඇති බැවින්, ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව | භූමිය උපරිම ඵලදායීතාවයෙන් යොදවා ගනිමින් මෙහෙවර ඉටු කර ගැනීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | තක්සේරු වටිනාකම රු.3,000,000 ක් වූ වාහන 03 ක් වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ භාවිතයෙන් තොරව පැවතුණි. | අපහරණය කිරිම කිරිම සඳහා සහ වෙනත් රාජ්‍ය ආයතනවලට පැවරීමට කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදී ඇති අනුමැතිය අනුව එම වාහන කාර්මික විද්‍යාලවල සිසුන්ගේ ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සඳහා ලබාදීම ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම් ඌන උපයෝජිත තත්ත්වය මඟහරවා භාවිතයට ගැනීම හෝ විධිමත් පරිදි අපහරණය කිරීම කළ යුතුය. |
| (උ) | තක්සේරු වටිනාකමෙහි එකතුව රු.4,850,000 ක වාහන 05 ක් වසර 2-4 ක් අතර කාලයක සිට නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව ප්‍රධාන කාර්යාලයේ හා මාතලේ දිස්ත්‍රික් කාර්යාලයේ ගාල් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | - එම - |
| (ඌ) | දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් පැවතියද රියදුරන් 48 දෙනෙකු සේවයේ යොදවා තිබුණු බැවින් අදාළ වාහන ඵලදායීව උපයෝජනය කිරීමට නොහැකිව තිබුණි. | අනුමත රියදුරු සේවක සංඛ්‍යාව 61 ක් වන අතර සේවයේ යොදවා ඇති රියදුරු සංඛ්‍යාව 47 කි. රියදුරු තනතුරේ පුරප්පාඩු 14 පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රියදුරු සබැඳිය වෙත දත්ත ඇතුළත් කර ඇති බව. | විධිමත් විශ්ලේෂණයක් කර අතිරික්ත වාහන බැහැර කිරීම හෝ පවතින වාහන උපරිම ඵලදායීව යොදා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. |
| (එ) | මාතලේ මධ්‍යම පැළ තවාන සඳහා 2021 වර්ෂයේදී රු.111,600 කට මිලදී ගත් ලීටර් 5000 වතුර ටැංකි 02 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ අපේක්ෂිත අරමුණට යොදාගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | අපේක්ෂිත අරමුණට යොදාගැනීමට කටයුතු කිරීම හෝ වෙනත් අවශ්‍යතාවය ඇති ආයතනයකට පවරා දීමට හෝ පියවර ගත යුතුය. |
| (ඒ) | දෙපාර්තමේන්තුව සතු මධ්‍යස්ථාන, පැළ තවාන් හා නිල නිවාස 09 ක් සතු ඉඩම් අක්කර 15.28 ක් කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි. | ස්වාභාවික භූවිෂමතා හේතුවෙන් වගාවන්ට යෝග්‍ය නොවන අයුරින් පිහිටා ඇති බිම් පාරිසරික සමතුලිතතතාවයට හානි නොවන අයුරින් පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත. ඉතිරි ව පවතින භූමි ප්‍රමාණය දෙපාර්තමේන්තුව වෙත ලැබෙන්නා වූ ප්‍රතිපාදන සීමාව තුළ උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීමට කටයුතු කරන ලෙස සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බව. | දෙපාර්තමේන්තුව සතු හිස් ඉඩම් ඵලදායීව යොදා ගැනීමට වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.4 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ.104(1) ප්‍රකාරව රජයට සිදුවන හානි පාඩු සම්බන්ධයෙන් වහාම කටයුතු කර රජයට සිදු වූ හානි පාඩු අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත් හානි පාඩු ප්‍රකාශයේ රු.3,037,216 ක ශේෂය තුළ පැවති වසර 1 ක් 10 ත් අතර කාලයක් තුළ සිදු වූ සිද්ධි 14 කට අදාළව රු.787,216 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | රු.166,850 ක වටිනාකම පොතෙන් කපා හැර ඇත. සිද්ධීන් 05 කට අදාළව රු.202,670 ක් අයකර ගැනීමට කටයුතු කරන බවත් සිද්ධි 2 කට අදාළව පරීක්ෂණ කමිටු පත්කර ඇති බවත් ඉතිරි සිද්ධි 06ට අදාළව මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත බව | අයකර ගැනීම සඳහා විධිමත් පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත්, රජයට සිදුවී ඇති හානි පාඩු වහාම අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. |
| (ආ) | මුල්හාල්කැලේ මධ්‍යම පැළ තවානේ රු.470,745 ක ද්‍රව්‍ය ඌණතාවයක් පැවතියද ඒ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණය සිදු කර අදාල වාර්තාව ලබාදී ඇති අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයේදී කිසියම් පුද්ගලයකුගේ වංචාවක්, නොසැලකිල්ලක්, අතපසුවීමක් හෝ ප්‍රමාදයක් හෝ වෙනත් වරදක් සිදුව නොමැති බව කමිටුව නිර්දේශ කර ඇති බව. | හානි පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්ව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 4.5 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව වාහන වලට අවශ්‍ය ටයර් අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු.2,416,265 ක ටයර් 50 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඉන් රු.1,812,231 ක ටයර් 35 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයට ටයර් 16 ක ශේෂයක් පවතින අතර කාර්මික දෝෂ හේතුවෙන් ගරාජ් වල නවතා ඇති වාහන ධාවනය කළ නොහැකි බැවින් එම ටයර් භාවිතය සඳහා නිකුත් නොවී පවතින බව. | විධිමත් අධ්‍යයනයකින් අවශ්‍යතා හඳුනා නොගෙන ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් අපනයන බෝග ව්‍යාප්තිය සඳහා බෝග පිළිබඳ පොත් මුද්‍රණය කර බෙදාහැරීමේ ක්‍රියාවලියක් සිදු කර තිබූ අතර එය ක්ෂේත්‍රගත කිරීම සඳහා 1996 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ විවිධ අවස්ථාවන් හිදී මුද්‍රණය කරන ලද රු.2,446,430 ක වටිනාකමින් යුත් පොත් 45,540 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරි වී පැවතුණි. | දැනට ඉතිරි ව ඇති තාක්ෂණික ප්‍රකාශන ප්‍රමාණය විවිධ ක්‍රමෝපායන් යොදා ගනිමින් පාර්ශවකරුවන්ට හා අපනයන කෘෂිකර්ම විෂය ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශවන් වෙත අලෙවි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඒකක භාර නිලධාරීන් දැනුවත් කර ඇති බව. | ඵලදායී වැඩපිළිවෙලක් යොදා පොත් අලෙවි කර ප්‍රජාව අතර කෙරෙන ව්‍යාප්තිය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදයට අදාළව දෙපාර්තමේන්තුවේ පැළ තවාන් 12 ක නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතා මට්ටම පැළ 3,005,000 ක් විය. උපරිම ධාරිතාවයෙන් නිෂ්පාදනය කර විධිමත් වැඩපිළිවෙලක් යටතේ ක්ෂේත්‍රගත කිරීමෙන් තොරව ලැබෙන ප්‍රතිපාදන හා ගොවි ඉල්ලීම් මත ක්ෂේත්‍රයට නිකුත් කළ පැළ ප්‍රමාණය 1,514,813 ක් විය. ඒ අනුව පැළ උපරිම ධාරිතාවයට සාපේක්ෂව ක්ෂේත්‍රයට පැළ නිකුත් කිරීම් සියයට 50 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. | දෙපාර්තමේන්තු මධ්‍යම පැළ තවාන්හි උපරිම නිෂ්පාදන ධාරිතාවයෙන් පැළ නිෂ්පාදනය සිදු කරනු නොලබයි. අදාළ පැළ තවාන වෙත ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් බෝගයන්ගෙන් ගොවීන්ගෙන් ලැබෙන ඉලලීම අදාළ කාල සීමාවේ පවත්නා වූ කාලගුණික දේශගුණික තත්ත්වයන්ගේ බලපෑම මත පැළ නිෂ්පාදන ප්‍රමාණය වෙනස් වේ. | පැල තවාන්වල උපරිම ධාරිතාවයෙන් පැළ නිෂ්පාදනය කර ක්ෂේත්‍රගත කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. |

**5. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ දක්වා තිබුණු අරමුණු අතරින් ආයතනයට අදාළව අරමුණු 05 ක් හඳුනාගෙන තිබුණද තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සම්බන්ධව නිශ්චිත වැඩසටහන් හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු තිරසර සංවර්ධණ අරමුණුවලට ගැලපෙන පරිදි නිශ්චිත සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන් සැලසුම් කර, (වාර්ෂික ක්‍රියාත්මත සැලැස්ම මඟින්) ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් දෙපාර්තමේන්තුව හඳුනාගෙන ඇති තිරසර සංවර්ධණ අරමුණු, ඉලක්ක කරා ළඟා වීමට කටයුතු කරනු ලබන බව. | නිශ්චිත වැඩසටහන් හා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්යය මණ්ඩලය හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 177 ක පුරප්පාඩු පවතින බවත් තනතුරු 10 ක් අතිරික්තව පවතින බවත් දක්වා තිබුණද අනුමත කාර්ය මණ්ඩලය වර්තමාන කාර්යභාරය හා සමාලෝචනය කර සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වර්තමාන කාර්යභාරය සමාලෝචනය කර අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 20 ම ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තු අරමුණුගත කාර්යයන් සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි. | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු 02 ක හා අධ්‍යක්ෂ(විශේෂ පර්යේෂණ) තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවා ඇත. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නි.අ./ස.අ.(පර්/සං) තනතුරු පුරප්පාඩු බව බඳවා ගැනීමේ සමාලෝචන කමිටුවට දන්වා යවා ඇති බව. | දෙපාර්තමේන්තු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් විශ්ලේෂණයක් කර අවශ්‍යම තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | දිස්ත්‍රික්/විෂයානුබද්ධ ව්‍යාප්ති නිලධාරී තනතුරු 17 ක් හා ප්‍රධාන තාක්ෂණික නිලධාරී තනතුරු 03 ක් පුරප්පාඩු පැවතීමත් හා ව්‍යාප්ති නිලධාරී තනතුරු 43 ක පුරප්පාඩු පැවතීම ක්ෂේත්‍ර කටයුතු මනා ලෙස පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | 2025.03.31 දිනට දිප ව්‍යාප්ත නිලධාරීන්ගේ පුරප්පාඩු 17 ක් පවතී. ප්‍රධාන තාක්ෂණ නිලධාරි තනතුරු 03 ම පුරප්පාඩුව පවති. මෙම විශේෂ ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකරනුයේ සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ වන අතර මෙම සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් නොමැත. ව්‍යාප්ති නිලධාරි පුරප්පාඩු 38 ක් පවතින බව. | ක්ෂේත්‍ර කටයුතු මනා ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුවේ. |